

# ඇතාගේ කතාව

ආර්. ප්‍රේමදාස



1252

1979 ජාත්‍යන්තර ළමා වර්ෂය වෙනුවෙනි



# ඇතාගේ කතාව

ආර්. ප්‍රේමදාස

ප්‍රකාශනය

දයාවංශ ජයකොඩි සහ සමාගම
101, ඇස්. මහින්ද මාවත, මරදාන, කොළඹ — 10.

10 GH 90

ප්‍රථම මුද්‍රණය 1979 ජුනි 23 දී
දෙවැනි මුද්‍රණය: 1987- අගෝස්තු 29 දී

| | |
|---|---|
| පරි. අංක | 1252 |
| වර්ග අංක | 891.483 |
| දිනය | |

1252
891.483

© ආර්. ප්‍රේමදාස


චිත්‍ර
සෝමසිරි හේරත්

මුද්‍රණය -
දයාවංශ ජයකොඩි සහ සමාගම - මුද්‍රණ ශිල්පියෝ
163/4, සිරි ධම්ම මාවත, මරදාන, කොළඹ — 10
අනුග්‍රහය -
ඕෂන් කලර් ප්‍රින්ටර්ස්-සිංගප්පූරුව

# ඇතාගේ කතාව

## 1

නිකිණි පාළු වැස්ස වැස්සට පස්සෙ යාල මහ වනයේ හැම ගසකම හැම වැලකම මල් පිපුණා. හැම තැනම මල්. මී මැස්සන්ගෙ ''හ්ම්.........'' සද්දෙ. බට්ටිච්චො ''චිවුච් චිවුච'' කිච්ච. කවුඩො ''හුච් චිච් චිවුච්'' කිච්ච. මොනරු ඉර නගින විටත් බහින විටත් ගල් උඩට නැගල පිල් විදහාගෙන නටනවා. ගෝන්නු මුවෝ බොරුවට අං පටලවා ගන්න හදනවා.



මේ කැළෑවේ ලස්සන තරුණ ඇතෙක් හිටියා. උසේ හැටියට මහතයි. මහතේ හැටියට උසයි. සෙල්ලක්කාරයා. නම ප්‍රතාප්. ප්‍රතාප් එයාගෙ ඇත් රළෙන් වෙන් වෙලා කැළේ හැම තැනම ඇවිදින්න ගත්තෙ මෙන්න මේ ලස්සන දවස්වල. එයා එයාගෙ අප්පච්චිගෙන් බොහොම දේවල් ඉගෙන ගෙන තිබුණ. කැළේ තියෙන ලස්සන තව තව බලන්නයි තව තව ඉගෙන ගන්නයි එයාට ඕන වුනා. අවුරුදු හැට හැත්තෑවක් තිස්සේ කැළේ ලස්සනයි අවලස්සනයි දැකල දැකල ප්‍රතාප්ගෙ අප්පච්චිට අම්මණ්ඩිට ඒවා එපා වෙලයි තිබුණෙ.

කැළේ තියෙන්නෙ බයලු. ඒත් ප්‍රතාප් කාටවත් බය වුනේ නෑ. ශක්තිය පමණක් නොවෙයි මොනම සිවුපාවෙකුටවත් නැති මොළේකුත් එයාට තිබුණා. එයා ඇලේ දොළේ පැනල නනා කිතුල් කරටි, පෝට වැල්, දිවුල්, අඹ කකා කකා ඇවිදිනවා. රට හොඬේ කටේ ඔබාගෙන නිදා ගන්නවා. හොඬේ කටේ ඔබාගෙන නිදාගන්නෙ බයටම නොවෙයි; හොඬේ දිගේ කටුස්සො යනවයි කියල අප්පච්චි එයාට උගන්වල තිබුණු නිසයි. ප්‍රතාප් අප්පච්චිට බොහොම ගරු කරනවා.

ප්‍රතාප් මේ ආකාරයට කැළේ සංචාරය කරද්දී නියගයක් ආවා. මාස තුනක් ගියා. එක වැහි බිංදුවක් පොළොවට වැටුනේ නෑ. අව් රස්නෙට ගස් වැල් පිච්චෙන්න ගත්ත. ඇල දොළ හිඳිල ගියා. ගංගාවල් වේලුනා. වතුර නැතුව සතුන් මැරි මැරී වැටුනා.



ප්‍රතාප් කිසි දේකින් කලබලයට පත්වුනේ නෑ. එයා එයාගෙ පුරුදු විනෝදකාමී ජීවිතය දිගටම ගෙන ගියා. කැළේ අනික් සත්තුන්ට හරි පුදුමයි. අහසින් වතුර වැටෙන කල්, ඒ වතුර ඇල දොළ ගංගාවල පිරෙන කල් එයා බලා හිටියෙ නෑ. ''වතුර ඉබේ අහසින් වැටෙනකල් ඒ නැත්නම් දෙපා අසලින් ගලා යන කල් බලා ඉන්න එපා. දිව දොට්ට දාගෙන මැරී වැටෙනකල් තේරුමක් නැතිව දුවන්නත් එපා. ඔළුව අතපය පාවිච්චි කරල මං වගේ වතුර හොයා ගනිල්ලා!'' ප්‍රතාප් මුළු වනයටම ඇහෙන්න කෑ ගහල කීවා.

ඉව අල්ල අල්ල ඇවිදිනව ඇරෙන්න වතුර හොයා ගන්නා ක්‍රමය සතුන් දැන සිටියේ නෑ. වතුර හොයා ගන්නේ කෙසේද කියලා ප්‍රතාප්ගෙන් අහන්නවත් කිසිම සතෙකුට කල්පනාවක් තිබුනේ නෑ. ඒ ගොල්ලො මරන බයෙන් බිරාන්ත වෙලයි හිටියෙ.

දවසක් ප්‍රතාප් කැලේ සියළුම සතුන්ට ඇසෙන්නට නැවතත් කෑ ගැසුවා. ''සත්තුනේ... කැලේ ඉන්න ඔක්කොම සත්තුනේ...... අහපල්ලා! මා පස්සෙන් වරෙල්ලා උඹලට වතුර හොයා ගන්න ක්‍රමය මං කියා දෙන්නම්. උඹලට අතපය වාරු නැත්නම් මං වතුර හොයා ගත්තම ඇවිල්ලා හැකි තරම් බීපල්ල''


ඇතාගෙ කතාව සැතපුම් ගණනක් දුරට ඇහුණා. ඌරො හිනා වුනා. ''අලිය කවද්ද අපිට වතුර දුන්නේ. අලිය නිකන් අලිය වෙන්න හදනවා. මේ කැලේ කැවෙ ඔය අලිය තමයි!'' ඌරො කිව්ව.

වතුර නැතිව මැරෙන්න වැටුනු ලොකු මීමෙකුව මැරෙන්නත් කලින් පොරකකා ලේ බී මස් ටික කා දමමින් සිටි නරි රංචුවකට අලියාගේ කෑ ගැම ඇසුණා. මේ කතාව ඇහුන පමණයි ඔක්කොම නරි හූ කියන්න ගත්ත.

''අලිය හතුර, අලිය අපේ හතුර, ඌට රැවටෙන්න එපා. අලි කවද්ද අපි වගේ දුප්පත් අහිංසක සතුන්ට වතුර දුන්නෙ? ඌට ගඟක වතුර ඕනෑ එක සැරේකට බොන්න. අපිටත් වතුර නැතිවුනේ ඌ නිසයි. අලිය පන්නල දනකල් අපට කවදාවත් හොඳින් ඉන්න ලැබෙන්නෙ නෑ''

නායක නරියා නරි රැලට මෙහෙම කිව්වාම නරි තොලකට ලෙවකකා මහ නරිය වටේ වටවුනා.

''අලියට තව හුවක් තියාපල්ලා'' නරි නායකයා කිව්වා පමණයි නරි හූවෙන් කැලේ දෙවනත් වුනා.



කබරයෙක් අකුල් අස්සෙන් මැරිච්ච මීමගෙ ඇටකටු ගොඩට ගාටනව දැක්ක නරිය ගලක් උඩට බයෙන් පැන්න. නරිය කබරයට බයයි. නරියගෙ මස් කන්නෙ කබරය පමණයි. අනික් කාරණය කබරයගෙ බාවට නරිය බයයි. කබරයා එයාගෙ බාවෙන් නරියගෙ මූණ පතුරු යන්න ගහනව.

ගල උඩට පැන්න නරි නායකයා නැවතත් කෑ ගාන්න වුනා.

''ගෝන්නුනේ, හරකුනේ, බූරුවනේ, රිළවුනේ, මුගටියනේ, කපුටනේ, අලිය ඇර අනිත් සහෝදරයිනේ, අලියා වතුර දෙනවලු. උඹල රැවටෙන්න එපා. අලිය නැති කරන්න උඹල අපිට උදව් වෙනව නම්, අප උඹලට වතුර දෙනව. උඹල ඉල්ලන ඉල්ලන දේවල් දෙනව!''

නරිය ගල උඩ ඉඳන් කෑ ගසද්දී ප්‍රතාප් කොළොම් අතු කැබැල්ලක් හොඬෙන් අරගෙන, එය වන වනා වැලි විතරක් තියෙන ගඟ දිහාට ආව. ප්‍රතාප් දැකපු නරි එක පාරට අකුලට රිංගල සද්ද නැතිව හැංගිල ඇස් ගෙඩි එළියට දගෙන බලා හිටිය.

''ඔය යන්නෙ. ඔය යන්නෙ. මේ කැළේට විනේ ඔය අලිය! පායන කොට පායන්නෙ, වහින කොට වහින්නෙ ඔය වල් අලිය නිසා'' නරි හෙමින් හෙමින් කුටු කුටු ගගා කියවන්න වුනා.

ප්‍රතාප් කොළොම් අත්ත වන වනා පුරුදු සෙල්ලම් ගමනින් ඉදිරියට යනව. එයා පස්සෙන් කුරුල්ලො වැල නොකැඩී ඇදෙනව.

''අලිය පස්සෙන් යන්නෙ කුරුල්ලො පමණයි. කකුල් හතරෙ එක සතෙක් යන්නෙ නෑ. අලිය පස්සෙන් යන තරමක් යන්නෙ කකුල් දෙකේ එවුන්'' නරි නැවතීමක් නැතිවම දිගටම කියෝනව.

## 2

මුවෙකුයි මුව දෙනකුයි ඒ දෙන්නගේ පුංචි පැටියයි වතුර හොයාගෙන ගඟට ආවා. මුවා ගං ඉවුරෙ හතර පැත්තම සෝදිසි කරනව. හිස හරෝන කොට ලොකු අං තට්ටුවත් හෙල්ලෙනව. එයා හොඳ තාත්ත කෙනෙක්. කොටියෙක් පුංචි පුතාව ඩැහැ ගන්න දවස් ගාණක් තිස්සෙ පස්සෙන් එන බව එයා දන්නව. ආවොත් දිය තිබහ පැත්තකින් තියල කොටි හම හත් අට පොළකින් හිල් කරන්න බලාගෙනයි එයා ඉන්නෙ.

පුංචි මුව පැටිය එයාගෙ අම්මත් එක්ක බැස්ස ගඟට. වැල්ල විතරයි. වතුර පොදක් නෑ. මුව පැටියගෙ දිව ගිලෙන්න කිට්ටුයි. එයාගෙ අම්ම ළඟත් කිරි නෑ. දිය තිබහ ඉවසන්න බැරිව අම්මගෙන් කිරි ඇද්දාම එයාගෙ කටට ලුණු රසට ආවෙ අම්මගෙ ලේ. වතුර නැතිව මළත් අම්මගෙන් කිරි ඉල්ලන්නෙ නැතේය කියල පුංචි මුව පැටිය හිතා ගත්ත.

පුංචි පැටිය අම්මටත් ඉස්සරවෙලා දුවගෙන ගියා වැල්ලට. ඉව කළා. එහෙම ඉව කරන කොට එයාගෙ අම්මටයි ඇඩුනෙ. පැටිය උඩ බැලුව. එතකොටත් පැටියගෙ දිව එළියට ඇදිච්ච ගමන්. අම්මගෙ ඇහේ කඳුළු.



''කිරි දෙන අම්මටත් තිබහ ඇති. ඒත් අම්ම අඩන්නෙ මා ගැනයි'' කියල මුව පැටියට හිතුන.

අහස දෙස බැලුව. ඉර මුදුන්වෙලා ගිණි පිටකරනව. අහසෙ එක වළාකුලක්වත් නෑ.

කුරුල්ලො කෑ ගහනව ඇහෙන කොට ගං ඉවුරෙ හිටිය මුවා බැලුව. ඉස්සරහින් අලියෙක්. කුරුල්ලො පිටිපස්සෙන් කුරුල්ලන්ගෙ. සද්දෙ මුවාට ඇහුනෙ වැහි වළාවක් එනව වගෙ.

''පුතා. පුතාගෙ අම්ම. දෙන්නම මෙහාට ආව නම්'' කියල මුවා කිව්ව. මුව අම්ම පැටියව හොම්බෙන් ඉස්සරහට තල්ලු කරගෙන ආව. පැටියගෙ පුංචි කකුල් පැටලෙනව. මුව අම්මගෙ කකුළුත් පැටළෙනව.

''ඇයි මෙයා......''

මුවා කතා කළේ නෑ. ළඟ ළඟම එන ප්‍රතාප් දිහාට හිස දික් කළා. මුව අම්මට දුක් කඳුළු වෙනුවට සතුටු කඳුළු උනන්න ගත්ත.

''අපේ දෙයියො, දෙයියො අපිට වතුර දෙයි. දෙයියො අපිට වතුර දෙයි දෙයි පුතා දෙයි දෙයි. ඉමූ. ඉමූ. තව චුට්ටක් ඉමූ ඉමූ''

ඇතා ආව. කොළොම් අත්ත පැත්තකට විසි කරල හොඬේ වනා වනා ආව. බැස්ස ගඟට. වැල්ලෙ වංගෙඩි වළවල් හද හද ඉව කර කර අඩි හතක් අටක් ඉස්සරහට ගියා. කුරුල්ලො ගඟ දෙපැත්තෙ තියෙන කුඹුක් ගස්වල සද්ද නැතිව බලා ඉන්නව. මුවයි මුව අම්මයි මුව පැටියයි ඇත ඉඳන් නොහෙල්ලී බලා ඉන්නව.

ප්‍රතාප් හොඬේ ඉස්සුව. හොඬේ ඉහ උඩින් තිබ්බ. මහ හඬින් එක සැරයක් කුංච නාදය කළා. සමහර කුරුල්ලො බය වුනා. සමහර කුරුල්ලො බය වුනේ නෑ. පුංචි මුව පැටියත් බය වුනා. එයාගෙ අම්මා එයාට බය වෙන්න එපා කිව්ව. ''බය නැතිව බලා ඉන්න පුතා. බලා ඉන්න. තව චුට්ටක් බලා ඉන්න'' එයා කිව්ව.

ඈත ඉඳන් නරි බලා ඉන්නව. ළඟ ඉඳන් කුරුල්ලො බලා ඉන්නව.

''අලිය කොහේද එච්චර එකක් කරන්නෙ? උගෙ සද්දන්ත ශරීරෙ තියෙන වංගෙඩි කකුල්වලට හැරෙන වළවල්වලට වතුර ඉනුවොත් මිසක්ක.........'' නරි ඈත ඉඳන් කතා කළේ ඒ විදියට.

ප්‍රතාප් ගුලි වුනා. එක තැන කැරකි කැරකි අතිනුයි පයිනුයි වැල්ලට පහර දෙන්න වුනා. වැලි ගල් කැට විසි වෙනව. පොළොව හෙල්ලෙනව. කුරුල්ලො හ්ම් සද්දයක් නෑ. මුව පැටිය වතුර තිබහත් අමතක වෙලා බලා ඉන්නව. එක තත්පරයක නැවතීමක් නෑ. එක දිගට එක දිගට ගහත් එක්ක පොරේ. ලොකු වළක් හැදෙනව. වැලි ගල් හතර අතේ විසි වෙනව.



විනාඩි පහයි ගියේ. අඩි හතරක් පහක් ජම්බුර, වටේ අඩි විස්සක් තිහක් ඇති වළක් හැදුන. හෙමින් ගොඩ වුනා වළේ ඉවුරට. ඔළුවයි ඇඟයි හොඳ ලස්සන ලතාවකට හොල්ල හොල්ල තවත් විනාඩි දෙකක් හිටිය.

කුරුල්ලො එක පාරට කෑ ගහන්න ගත්ත. වළට ඉහළින් එහාටත් මෙහාටත් ඉගිල්ලෙන්න වුනා.

ප්‍රතාප් හෙමින් හොඬේ වළ ඇතුළට දැම්ම. ඉස්සුව ඉහ උඩින්. හොඬේ අගින් ගස්වල මුදුන් කරටිවලටත් ඉහළින් යන්න සූස් කියල වතුර මලක් වගෙ වතුර පිටවුනා!

කුරුල්ලො ගී කියනව. නැටුම් නටනව. උන්ට ඉවසන්න බැරි තරම් සන්තෝෂයි.

''දැක්කද පුතේ දැක්කද ...... අලි උන්නාන්සෙ වතුර ගත්ත හැටි දැක්කද? ඕං ඕං වැහි බිංදු මේ පැත්තටත් හුළඟෙ එනව'' මුව පැටියගෙ අම්මට සන්තෝෂය උහුලන්න බැරිව කෑ ගහනව.

ප්‍රතාප් තුන් හතර වතාවක් හොඬෙන් වතුර අරන් බිව්ව. අන්තිම වතුර උගුරත් බීල ඇස් දෙක අරින කොට මුව පැටිය තමන් ඉස්සරහට දුවගෙන ඇවිල්ල බයෙන් බලා ඉන්නව දැක්ක. මුව අම්ම මුව පැටියට පිටු පස්සෙන්.

''තිබහද පැටියො තිබහද — වතුර තිබහද?''

මුව පැටිය ප්‍රතාප්ට තාමත් බයයි. එයා අඩියක් පස්සට පැනල අම්මට තුරුළු වුනාම මුව අම්ම කතා කළා.

''එහෙමයි එහෙමයි. අපි ඔක්කෝටම තිබහයි. තව පැයක් දෙකක් වතුර නැතිව උන්නා නම් අපි තුන් දෙනාටම මැරෙන්නයි වෙන්නෙ. තමුන්නාන්සෙ දෙයියො වගෙ අපිට පිහිට වුණා''

''ඉතිං ඔය තියෙන්නෙ. බොන එකනෙ තියෙන්නෙ.........''

කුරුල්ලො එකා එකා පාත්වෙලා උගුරක් බොනව වටපිට බලනව. උගුරක් බොනව වටපිට බලනව.

ප්‍රතාප් මුව පවුල දෙස නැවතත් බැලුව. ''ඇයි බලා ඉන්නෙ? හෙවෙන් වතුර නම් තියෙන්නෙත් වතුර නම් ඇයි නො බී ඉන්නෙ?''

''අපිට බය හිතෙනව'' මුව අම්ම කිව්ව.

''මට ද?''

''එහෙමයි''


''ඇයි මං ඔහේලට හරි කැළේ ඉන්න වෙන සතෙකුට හරි කවදාවත් වරදක් කරල තියෙනවද? මං මස් කන්නෙ නෑ. මං කන්නෙ කොළ වැල් පොතු ජාති''

''තමුන්නාන්සෙ අපිට කවමකවදාවත් වරදක් කරලා නෑ. කරපු බවක් අහලවත් නෑ. එහෙම වුණත් ඌරො නරි තමුන්නාන්සෙ ගැන අපිට බය හිතෙන කතා කියනව''

''මං ඌරෙකුටවත් නරියෙකුටවත් කවදාවත් වරදක් කරලා නෑ. කමක් නෑ. අපි පස්සෙ දවසක ඌරො ගැන නරි ගැන කතා කරමු. දැන් වතුර බීල ඉන්න. මං යන්නම්......''

ඇතා කතා කළේ තරමක කළකිරීමකිනැයි මුව අම්ම සිතුව. ඒ සැණින් ඌරන් ගැනත් නරින් ගැනත් එයාට පිළිකුලක් ඇති වුනා.

ප්‍රතාප් ගං ඉවුරට ගොඩ වී, පසු පස හැරී බැලුව.



මුව පැටියත් මුව අම්මත් ලහි ලහියේ වතුර බොනව. මුවා වළ ළඟටම පැමිණ වළට නො බැස අං තට්ටුව සොළවසොළවා වට පිට බලනව. කුරුල්ලො වළ වටේටම වටවෙලා. සමහර කුරුල්ලො ඉගිල්ලෙන ගමන් වතුර බොනව.

කනස්සල්ල පහ වෙලා ප්‍රතාප්ට සතුටක් ඇතිවුනා. ''කවුරු මා ගැන කොහොම හිතුවත් මා නිසා තිබහ නිවා ගන්න එක මට ආඩම්බරයක්''

හාවෙක් දුවගෙන දුවගෙන ආව. නැවතුනා. නැවතත් පිම් හතක් අටක් ඉදිරියට පැන්න. නැවතුනා. අත් දෙක උසස් ගත්ත. කකුල් දෙකින් හිට

ගත්ත. කන් දුන්න. කන්දීගෙන විනාඩි බාගයක් ඉඳල වටපිට බලල, පිමි දෙකට මුව පැටිය ළඟට පැනල වතුර උගුරු දෙකක් තුනක් බිව්ව. ආපසු හැරුන. පස්සවත් නොබලා වේගයෙන් දුවගෙන ගියා.

ප්‍රතාප් තනිවම කතා කරනව. ''පච් උඹල හැම තිස්සෙම ඉන්නෙ බයෙන්. උඹලගෙ පපුව කොච්චරවත්ම බයෙන් ගිඩි ගිඩි ගගා ගැහෙන හැටි මං දන්නව. නරි උඹල පස්සෙන් එලෝන කොට පමණක් නොවෙයි, උන් ඇවිත් සිනාවෙන කොටත් දුවපල්ල!''

# 3

ඇතා බුදිය. ගඟ කිට්ටුව කොළොම් ගස් සෙවණේ කොළොම් ගසට පිට දී සිටගෙනම බුදිය. ඒ ඉතාම කෙටි සැහැල්ලු නින්දකි. හිරු තවමත් සැඩ හිරු රැස් පිට කරමින් පොළොව දවයි. හමන සුළඟ ද වියළිය. ඒ වියළි සුළඟ වියළි කොළ රොඩු එක්කාසු කරගෙන ඒ අතටත් මෙ අතටත් දුව පනියි.



කුරුල්ලෝ එක්වරම කෑගා ඉගිළ ගොස් කුඹුක් අතුවල වැසුව. ප්‍රතාප් සිටියේ ඒ හඬ ඇසෙන කිට්ටුවක නොවේ. මුව මවට හා මුව පැටවාට පසු, මුවා වතුර බී ගොඩට ආවා පමණය. හිටි-හැටියේ මිටි පඳුරු තළා පොඩිකර උකු ගස ගසා ඌරන් රංචුවක් දුවගෙන අවුත් වතුර වලට පැන්න.

පළමුවෙන් වතුර වළට පැන්නේ නායක ඌරායි. ඒ ඌරා පිටුපසින් ඒ ඌරාගේ පැටවුන් ද වළට පැන්න. දළ ඇති මස් කඩා වැටෙන ලොකු ලොකු ඌරෝ අනෙක් ඌරන් පෙරළාගෙන ඉදිරියට ආවා. වතුර වළ මඩවළක් වීමට ගත වුනේ ඉතා සුළු වේලාවක්. දුගඳ පැතුරුනා. පිළිකුල දැඩිවුනා. කුරුල්ලො ඉගිල්ලිලා ගියා. ගෝනුන් ද මුවන් ද හරකුන්ද වතුර වළට ඉව අල්ලමින් පැමිණ සිටියත්, ඌරන්ට වතුර වළ අයත් වූ අයුරු දැක බලාපොරොත්තු අත් හැර ආපසු යන්නට වුනා. වතුර වළට ඉව අල්ලමින් පුරුදු රැවටිලි සිනාව නගමින් ඉදිරියට ගමන් කළේ නරින් පමණයි.

ඌරන් වතුර වළ මඩවළක් කර ගනිමින් මඩ නාද්දී, ලඟි ලඟියේ පැමිණි නායක නරියා ඌරු නායකයාට කටපුරා සිනාසුනා.

''තමුන්නාන්සේ නානව වගෙ ?''

''නානව නොවෙයි වතුර බොනව''

''මං හිතුව නානව කියල.........''

''නාන්නත් ඕනැ තමයි''

නරියා තවත් ළං වුනා. නොඉවසිය හැකි දුගඳක් හමා ආවත්, පිපාසය නිසා ඉවසිය යුතුව ඇතැයි කල්පනා කළා.

''කෝ අලිය? මෙතන හිටපු වල් අලියා? මේ වළේ වතුර ටික උගෙ මකර කටේ ඔබනව මං දැක්ක'' නරියා නැවත කිව.

''මෙහෙ ඇති අලියෙක් නෑ. හිටිය නම් අපි එනව දැක්කාම දුවන්න ඇති''

ඌරු රජා මෙසේ කියා හොම්බෙන් වළේ ඉවුරට ඇන්නා. ඔහු අනුකරණය කළ සෙසු ඌරෝ ද ඉවුරට ඇන ඇන ඉවුර පෙරළා දැම්ම. බලා සිටියදී වළේ වතුර සිඳිගෙන යනව.

නරියා වළ ඇතුළට හෙමින් හෙමින් අඩි මාරු කළා. කතාවෙන් කතාවෙන් මඩ වතුර උගුරක් බී කට ඇඹුල් කළා.

''සහෝදරයිනේ, අලිලයි අපිලයි අහසට පොළොව වගෙ-නැද්ද? උඹලයි අපිලයි අයියල මල්ලිල වගෙ – සහෝදරයො වගෙ – නැද්ද? අපේ අදහස් එකයි.. අපි හරි අහිංසකයි – නැද්ද?''

''ඒක ඇත්ත'' අහංකාර ඌරු රජා වළ වටේටම වටයක් පෙරළීගෙන ගියා.



නරි ඔක්කොම හෙමින් හෙමින් වළ වටේට වටවෙලා එකා එකා වළට බැස්ස. බැහැල උගුර උගුර බොනව. ඌරන්ට කතාව දනව. හිනාවෙනව.

''වතුරවලට පොඩ්ඩක් ලුණු වැඩි වගෙ'' එක නරියෙක් කියන කොට අනික් නරිය කියනව ''ලුණු වැඩි නෑ ඕයි. වැඩිවෙලා තියෙන්නෙ ගොරක''

ඌරෙකුත් කතාවට පැටලිලා කියනවා,

''ලූණු ඇඹුල් ගානට තියෙනව. වැරැද්ද තමුසෙලාගෙ නරි ගඳ!''

''නරි ගඳ?'' එක නරියෙකුට කේන්ති ගියා.

''නරි ගඳ නැතිව සුවඳ ද?'' ඌරෝ කිව්ව.

''ඌරො විතර ගඳ නෑ!''

''ඌරො ගඳයි කිව්ව?'' ඌරටත් කේන්ති ගියා.

''ඌරො ගඳ නැතිව සුවඳ ද?''

ඌරා දළේ විළිස්සාගෙන නරියට පැන්න. නරිය පස්සට පැනල හිනාවුනා.

''තමුසෙට කොලොප්පමක්වත් තේරෙන්නේ නැති හැටි!''

නරි නායකයා කතාවට මැදිහත් වුනේ නෑ. ඌරු රජා ළඟට වෙලා මඩ නානව. ඌරු පැටවුන්ට පේන්න පිනුම් ගහනව. ඌරු පැටව් හිනා වෙනව. මහ ඌරටත් හිනා.

''අලිය අපේ හතුර. අපි දෙගොල්ලො එක්කාසු වුනොත් ඔය අලියව මේ කැළෙන් පන්නල දන්න පුළුවන් – නැද්ද?'' නරි නායකයා කිව්ව.

''කවුරුවත් ඕනැ නෑ අලියව මට්ටු කරන්න. අපිට පුළුවන්'' අහංකාර ඌරු රජා උත්තර දුන්න.

''ඒ වුනාට හලෝ ලේසි නෑ. එක්කාසු වුනොත් නම් ආයිත් වරදින්නේ නෑ. අපේ මොළෙයි ඔහේලගෙ ශරීරෙයි එක්කාසු කළොත් ඕනැම සද්දන්ත ඇතෙක් බිම දන්න පුලුවන් – නැද්ද?''

''මොකද අපිට මොළේ නැතේ කියල හිතුවද?''

''නැතේයි කිව්වායැ. තමුන්නාන්සේලාගේ මොළේ විතර ලොකු නෑ අපේ මොළේ. ඒ වුණාට අපේ මොළෙත් ඔය පැත්තකින් තිබුනොත් නරකකට හිටින්නෙ නෑ – නැද්ද?''

''එහෙනම් පැත්තකින් හිටිල්ල!''

ඌරොත් නරිත් එක ගොඩේ දඟලනව. වතුර වළ තවත් මඩ වෙනව. ඒ මඩ වගුරට ඌරු වසුරු නරි වසුරු මුසුවෙනව.

ඌරන්ගේ ගඳ නරින්ටත් නරින්ගේ ගඳ ඌරන්ටත් දැනුන. ඌරො නරි දිහාත්, නරි ඌරො දිහාත් බැලුව. නරින්ගේ ඇඟේ ඌරු වසුරු. ඌරන්ගෙ ඇඟේ නරි වසුරු. ඌරො හොට දික්කරගෙන එක පැත්තකට වුනා. නරි හොම්බ උල්කරගෙන අනික් පැත්තකට වුනා.

''අපූරුවට තිබුණු වතුර වල ජරා කලා නේද ජරා නරියනේ.....?'' ඌරු රජා දළ විලිස්සල කේන්තියෙන් පිපිරි පිපිරි කෑ ගැව.

''නම්බුවට කතා කරනව හලෝ! වළ ජරා කළේ අපි නොවෙයි උඹල. උඹලගෙ දහ ජරාව මේ බලාපල්ලා අපේ ඇඟේත් ගෑවිල. කොච්චර ලස්සනට සිනිඳුවට ළපටියට තියෙන ශරීරවල් ද? මීට පස්සෙ උඹල යන පාරකින්වත් අපි යන්නෙ නෑ. තේරුනාද ඌරනේ......''




ඌරොයි නරියි විනාඩි හතරක් පහක් තිස්සෙ බැණ ගත්ත. නරි එක පාරටම ගං ඉවුරට පැන්න. පැනල ඌරන්ට දිග හූවක් තියල කැළෑවට වැදුන. ඌරො නරින් පස්සෙන් එළවන්න වුනා. ඌරො හැරෙන කොට නරි ගිහිල්ලත් ඉවරයි.

## 4

ප්‍රතාප් ඇහැරුනේ නරින්ගෙ හූවට. එයා ආපසු ආව. ගඟේ ඉවුර උඩට අවුත් වතුර වළ දෙස බැලුව. වළේ එක වතුර පොදක් නෑ. ඉවුරු කඩාබිඳ දල. ඌරු වසුරු වලින් නරි වසුරුවලින් වළේ අඩිය පිරිල. ඒ පැත්තම ගඳයි. එයා වෙච්චදේ හිතා ගත්ත.

''හොඳයි මං තවත් වතුර වළක් හාරනව. ලොකු වතුර වළක් හාරනව. බලමු ඌරනුයි නරිනුයි ඇවිදින් ඒකත් කැත කරල විනාශ කරල දමයි ද කියල'' ප්‍රතාප් හිතුව.

ප්‍රතාප් ගහට බැස්ස. පළමු වළට ඉහළින් තැනක් තෝරා ගත්ත. මොහොතක් බලා හිටියෙ නෑ. නැවතත් අර පුරුදු සෙල්ලම. පළමු වළ හාරන්න ගියේ විනාඩි පහයි. මෙ වළ හාරන්න විනාඩි දහයක් ගියා. නරින්ගෙයි ඌරන්ගෙයි කැත වැඩේ නිසා එයාගෙ හිත නොහොඳිනුයි තිබුණෙ. ඒ නිසා පා පහරවල් අත් පහරවල් පළමු වතාවට වඩා වේගයෙන් පොළොවෙ වැදුන. මෙදා, බූරුල් කරන පස් වැලි ගොඩට වීසි කරන්න හොඩෙත් ප්‍රයෝජනයට ගත්ත.



වළ හාරල ගොඩට ආපු ප්‍රතාප් දැක්ක ගං ඉවුර දිගේ ලොකු කුඩා සතුන් දහස් ගණන් වතුර බොන්න නො ඉවසිල්ලෙන් බලා ඉන්නවා ගොන් නාම්බො තරමක් කලබලයෙන් හැසුරුනත් හාවුන්ගෙ මූවන්ගෙ ගෝනුන්ගෙ හැසිරීමට ප්‍රතාප් කැමති වුනා. ගොන් නාම්බොත් නරක නෑ. ඒ ගොල්ලන් පසුගිය කාලයේ නරක් වුණේ ඌරන්ගෙයි නරින්ගෙයි වරදින් බව ප්‍රතාප් දන්නව.

ප්‍රතාප් ඉස්සෙල්ල වගේම වළට පාත් වුණා. පාත්වෙලා හොඩෙන් වතුර අරන් බොන්න ඉස්සෙල්ල මුළු ඇඟ පුරාම වතුර ගහ ගත්ත. ඊට පස්සෙ බිව්ව.

නරියි ඌරොයි නැවතත් සමගිවෙලා. ඒත් ගඳ තවම ගිහිං නෑ. ඒ දෙගොල්ලො හෙමින් හෙමින් කිට්ටු කරනව.

ප්‍රතාප් වටේ වටවෙලා ඉන්න ගෝනුන් මුවන් මීමුන් දිහා බලල, ඇත එන නරිනුයි ඌරනුයි දිහාත් බැලුව. ගෝන්නුත්, මුවොත්, මීමමුන් බැලුව ඌරනුයි නරිනුයි දිහා. ඒ ගොල්ලන්ගේ ඇඟේ මවිල් කෙළින් වුනා කේන්තියෙන් ඇස් රතු වුනා. ඇඟට වෙර ගත්ත. අං කෙළින් කර ගත්ත. වේගයෙන් ඌරන් නරින් පස්සෙන් එළවන්න වුනා.



ඉස්සරවෙලාම ආපසු දිව්වේ ඌරු නායකයා. දෙවැනිවට දිව්වෙ නරි නායකයා. නරි ඉඩෝරයට වේලිච්ච මාන පඳුරු උඩින් පැන්න. ඌරො මාන පඳුරු පෙරළාගෙන දිව්වා.

ප්‍රතාප් ගං ඉවුරට වෙලා හොඬේ වන වනා කවදවත් නැති තරම් සන්තෝෂයෙන් පැද්දුනා. එහෙම පැද්දෙන ගමන් සතුන්ට මෙහෙම කිව්වා. ''සත්තුනේ......උඹල තේරුම් ගත්ත. උඹල ඌරන්ගෙයි නරින්ගෙයි හැටි තේරුම් ගත්ත. මට ඕනැකරල තිබුනෙත් උඹලට ඕක උගන්වන්නයි. දැන් ඉතින් ආපසු ඇවිත් දිය බීල, සාමදනයෙන් ආපසු පලයල්ල. මේ වතුර වළ උඹලටයි. වැස්ස වැහැල ගඟ දිගේ වතුර ගලන කල් උඹල ඒක රැක බලා ගනිල්ල. එක ඌරෙකුට එක නරියෙකුට පැත්ත පළාතට එන්න දෙන්න එපා''

ඉර බැහැගෙන යනව. ගස්මුදුන්වල තවමත් හිරුරැස් වැතිරිල. ප්‍රතාප් තමන්ගේ චාරිකාව නැවතත් ඇරඹුව.

නිමි

REFERENCE



එතුමාට ඇඹ ආත්ම ශක්තිය හා අධිෂ්ඨාන බලය දැඩි ලෙස පහළ වූයේ පරාජයේදීත් පරිහාසයේදීත්ය. ඒවායින් පන්නරය ලද වරිත ශක්තියත්, ආත්ම විශ්වාසයත් ඇති එතුමා දීර්ඝ දුර්ග මාර්ගයේ ඉදිරියටම ඇදී ආවේය. කරදර දුක් ගැහැට, අපහාස උපහාස හා ගෙරවුම් මැද එතුමා පැමිණි ඒ දුෂ්කර ගමන අපටද අපගේ ආත්ම ශක්තිය හා අධිෂ්ඨාන බලය මතුකර ගන්නට අනුබල දෙයි.

මහත් වගකීම් සහිත, ඒ වගකීම් සියල්ල සපුරා ඉටුකරන ගරු ආර්. ප්‍රේමදස අගමැති තුමන්ගේ කාර්ය බහුල ජීවිතය ගැන සිතන විට එතුමාට පතක් පොතක් ලියන්නට තබා පතක් පොතක් කියවන්නටවත් අවකාශයක් ඇතැයි නොසිතේ. එහෙත් වගකීම් සැහැල්ලු ලෙසින් දැරීමට අවශ්‍ය වූ ආත්ම ශක්තිය හා ආත්ම සංයමය එතුමා ලද්දේ ගැඹුරු ලෙස කියවීමෙන් ලැබූ හැඟීම් තුළිනි; ඒවා ලිවීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් ලත් අත්දැකීම් වලිනි. එතුමා තරම් කියවන්නෙක් එතුමා තරම් ලියන්නෙක් දේශපාලනඥයින් අතර තවත් නැතැයි එතුමා ළඟින් ඇසුරු කරන්නෝ දනිති. දහසක් වැඩ රාජකාරි අස්සේ ලබන සුළු විවේකයකදී දින පොතක් එළියට ඇද එහි තමා ලියූ කවියක් ගීයක් හෙමිහිට ශබ්ද නඟා ඔහු කියවයි. එතුමාගේ ජීවිතයේ දක්නට ලැබෙන මටසිළිට හා නිහතමානිත්වය, කලාකරුවකු වශයෙන් එතුමා තුළ ඇති වින්දන නිර්මාණ කුශලතාවයේ ප්‍රතිඵලයකි.

ජාත්‍යන්තර ළමා වර්ෂය වෙනුවෙන් මේ රටේ දරුවන්ට එතුමා දෙන මාහැඟි තිළිණය 'ඇතාගේ කතාව' යි. යාල මහවනයේදී ලත් අත්දැකීම් පදනම් කරගෙන නිර්මාණාත්මකව ගොතා ඇති මෙම ළමා කතාව කුඩා දරුවන්ට මෙන්ම පැසුනු වැඩිහිටියන්ටද කියවා රස විඳිය හැකිය; රස විඳ නැවතත් ආවර්ජනය කළ හැකිය; ආවර්ජනය කොට සමාජය පිළිබඳ යථාවබෝධය පහළකර ගත හැකිය.

දයාවංශ ජයකොඩි සහ සමාගම